# දෙරණ - ශ්‍රී කල්‍යාණි
# වෙසක් කලාපය 2025

අසිරිමත් තෙමඟුල නිමිත්තෙන් සහ සම්බුදුරජාණන් වහන්සේ පන්සියයක් මහා රහතුන් වහන්සේලා සමඟ උතුම් කැලණිය පුද බිමට වැඩම කිරීම නිමිතිකොටගෙන, මිලියන 04 කට අධික ජන සහභාගීත්වයකින් සංවිධානය වන දිවයිනේ විශාලතම වෙසක් කලාපය කැලණිය රාජමහා විහාරස්ථානයේදී,
**වෙසක් පොහෝ දින මැයි 12 සිට මැයි මස 18 දක්වා**

**1. මහා වෙසක් පහන් කූඩු තරගාවලිය - මැයි මස 12 වන වෙසක් පුන් පොහෝ දින සිට 18 වන ඉරු දින දක්වා**





දිවයින පුරා විසිරී සිටින දක්ෂ නිර්මාණකරුවන් අතින් නිමවෙන පහන් කූඩු නිර්මාණ තරගාවලිය

**ජයග්‍රාහකයින් සඳහා ත්‍යාග**

- ප්‍රථම ස්ථානය - රු.400,000
- දෙවන ස්ථානය - රු.250,000
- තෙවන ස්ථානය - රු.150,000

- හොඳම තාක්ෂණික පහන් කූඩු නිර්මාණය - රු.50,000
- හොඳම පරිසර හිතකාමී පහන් කූඩු නිර්මාණය - රු. 50,000
- සැනසිලි ත්‍යාග - රු.20,000 බැගින් නිර්මාණ 10 ක් සඳහා ප්‍රදානය කෙරේ

**2. මහා වෙසක් පහන් කූඩුව - මැයි මස 12 වන වෙසක් පුන් පොහෝ දින සිට 18 වන ඉරු දින දක්වා**





දහම් පාසල් සිසුන් සහ නිර්මාණකරුවන් අතින් නිමවෙන මීටර 10 කට ආසන්න උසකින් යුත් මහා පහන් කූඩුව

**3. .ශ්‍රී කල්‍යාණි ධර්ම විද්‍යාලයීය සිසුන් 200 කට අධික පිරිසක් ඉදිරිපත් කරන භක්ති ගීත ප්‍රසංගය**
**මැයි 12 වන දින හා 13 දෙදින පස්වරු 7.00 සිට**





4. .ශ්‍රී ලාංකේය ඉතිහාසයේ ප්‍රථම වතාවට ඉදිරිපත් කරන LED සජීවිකරණ වෙසක් තාක්ෂණික නිර්මාණය

  

අඩි 20 කට අධික උසකින් ඉදිවන දිවයිනේ විශාලතම **LED** සජීවිකරණ වෙසක් නිර්මාණය වන මෙය බුදුරජාණන් වහන්සේ වැඩ සිටින ලෙස නිර්මාණය වීමට නියමිතය

5 .අම්බලන්ගොඩ පාරම්පරික රූකඩ ශිල්පින් ඉදිරිපත් කරන විචිත්‍රවත් රූකඩ සංදර්ශන මාලාවමැයි 12 වන දින හා 13 දෙදින පස්වරු 8.00 සිට

  

අසිරිමත් වෙසක් උත්සවය වෙනුවෙන් හෙළ කලා ශිල්ප නූතන පරපුරට දායාද කිරීමේ අරමුණෙන් සංවිධානය වන දෙදින රූකඩ සංදර්ශනය ජාතක කථා ආශ්‍රයෙන් සංවිධානය වීමට නියමිතය.

6. ශ්‍රී කල්‍යාණී ධර්ම විද්‍යාලයීය සිසුන් ඉදිරිපත් කරන සංස්කෘතික හා සෞන්දර්යාත්මක ප්‍රසංගය මැයි 14 හා 15 දෙදින පස්වරු 7.00 සිට

  

9. කැලණිය තුරුණු මෙත් ගුණ සමාධිය 2025 - විශේෂ තරුණ මෛත්‍රී භාවනා වැඩසටහන

  

මෙවර වෙසක් කලාපයෙහි, උතුම් ප්‍රතිපත්ති පූජාවන්ට මුල්තැන ලබාදීමටද සංවිධායක මණ්ඩලය කටයුතු කර ඇත.

ඒ අනුව වයස අවුරුදු 16-35 අතර වයසේ පසුවන 1000 ක් තරුණ තරුණියන් සඳහා පමණක් 'කැලණිය තුරුණු මෙත් ගුණ සමාධිය 2025' නමින් විශේෂ මෛත්‍රී භාවනා වැඩසටහනක් ලෝකයේ විශාලතම ධාන්‍යාකාර චෛත්‍ය රාජයාණන් වහන්සේ පිහිටි, ඓතිහාසික කැලණිය රජමහා විහාරයේ සෑ මළුවේදී, 2025 වෙසක් සතියේ, මැයි මස 15 වන සවස 4.30 සිට 6.00 දක්වා පැවැත්වීමට නියමිතය.

ප්‍රතිපත්ති පූජාවෙන් තුරුණු සිත් මෙත් සිතින් සුවපත් කරන්නට වෙර දරණ අපේ උත්සාහයට සම්බන්ධ වන ඔබට අපගේ ගෞරවණීය ස්තූති

---

වෙසක් කූඩු තරගාවලියේ සහ අනෙකුත් අංගයන්ගේ ජයග්‍රාහකයින් සහ සහභාගී වුවන්
ඇගයෙන ත්‍යාග ප්‍රදානෝත්සවය - මැයි මස 18 වන දින සවස 7.00 ට

## තුන් සිත් පහදවාගෙන කැලණි වෙසක් සිරි නරඹන්නට
## **ඔබට බැතිසිතින් ආරාධනා.**

මිලියන සංඛ්‍යාත සැදැහැවතුන් සහභාගී වී තුන්සිත් පහදවා ගන්නා වසරේ උතුම්ම පූජාව සාර්ථක කරගැනීම වෙනුවෙන් ඔබගේ ගෞරවණීය මූල්‍ය දායකත්වය අප බලාපොරොත්තු වන්නෙමු

**සම සංවිධානය**
**ශ්‍රී කල්‍යාණී ධර්ම විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය සහ දෙරණ මාධ්‍ය ජාලය**

**076 215 4946 - අමිල දිල්ශාන්, සභාපති**
**071 609 6978 - කසුන් අනුරාධ, භාණ්ඩාගාරික**